# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 29 දරන
# වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 අගෝස්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි		තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 29 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 10/83.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 29 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ 12 වන වගන්තියෙහි "මාණ්ඩලික නිලධරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අළුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1975 අංක 1 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"මාණ්ඩලික නිලධරයා" යන්නෙන්—

(අ) ආණ්ඩුවේ හෝ පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට, වර්ෂයකට රුපියල් 13,800 ක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයක් ඇති, ස්වකීය වැටුප් වර්ධක වර්ෂයකට රුපියල් 480 ක් සහ ඊට වැඩි වන්නා වූ යම් ධුරයක් දරන නිලධරයෙක් අදහස් වේ; තවද

(ආ) රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට වර්ෂයකට රුපියල් 9,600 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයක් හෝ පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරන ලද වෙනත් යම් වැටුපක් සහිත යම් ධුරයක් දරන යම් නිලධරයෙක් අදහස් වේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.